**Centre for Policy Alternatives**
**විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය**
**மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்**

# යෝජිත ත්‍රස්ත විරෝධී පනත (ATA) - අවධානය යොමු කළ යුතු ප්‍රධාන කරුණු
## විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (CPA)
## 2023 මැයි

උනන්දුවක් දක්වන පාර්ශවයන් විසින් ත්‍රස්ත විරෝධී පනත (Anti-Terrorism Act - ATA) පිළිබඳ යෝජනා ඉදිරිපත් කරන ලෙස ඉල්ලා අධිකරණ අමාත්‍යාංශය විසින් වර්ෂ 2023 මැයි 2 දින නිකුත් කරන ලද දැන්වීමට ප්‍රතිචාර වශයෙන්, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් අතීතයේ සිටම ඉස්මතු කර ඇති පරිදි මේ සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතු ප්‍රධාන ගැටලුකාරී තත්ත්වයන් සම්බන්ධයෙන් කරනු ලබන මූලික අදහසක් දැක්වීමක් පහත ලේඛනයේ අඩංගු වේ.

ත්‍රස්තවාදය නම් වරද පුළුල් ලෙස රාමුගත කිරීම, දීර්ඝ කාලීනව රිමාන්ඩ් භාරයට පත් කිරීමේ කාල සීමාවන් සමඟ චෝදනාවකින් තොරව රඳවා තබා ගැනීම, අධිකරණයට අගතිගාමී වන පරිදි විධායකයට ලබා දී ඇති අධික බලතල සහ මිලිටරිකරණය උත්සන්න වීම ඇතුළුව, පහතින් ඉස්මතු කර ඇති ගැටළුකාරී විධිවිධානවල බරපතලභාවය මත පදනම්ව මෙකී යෝජිත ත්‍රස්ත විරෝධී පනත ඉවත් කරගන්නා ලෙසට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ආණ්ඩුවෙන් ඉල්ලා සිටී.

මේ මොහොතේ දී ත්‍රස්ත විරෝධී පනත පුළුල් ලෙස සංශෝධනය කිරීමට රජය විසින් ගනු ලබන දැනටමත් ප්‍රමාද වී ඇති සහ කඩිමුඩියේ ගනු ලබන ප්‍රයත්නයන් ඔස්සේ මෙකී පනතේ ගැටලුකාරී තත්ත්වයන් සම්බන්ධයෙන් ඉස්මතු කර ඇති මූලික ප්‍රශ්න වලට විසඳුම් සෙවීමට නොහැකි වනවා පමණක් නොව, එය කෙටුම්පත් කිරීමේ දී ඒ සම්බන්ධයෙන් අදහස් ලබා ගැනීම සඳහා පවතින සීමිත අවස්ථාව හේතුවෙන් එකී පනත වූ කලී ගැටළු සහගත ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ද වනු ඇත. ඕනෑම අව්‍යාජ සාකච්ඡාවකට ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ සැබෑ බලපෑම සහ එකී පනත හරහා ජනිත කර ඇති මානව පිරිවැය, වධහිංසා සහ අපයෝජනයන් අවබෝධ කර ගැනීම සඳහා දිගුකාලීන රැඳවියන් සහ ඔවුන්ගේ සමීපතමයන් ඇතුළුව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත හරහා සෘජුවම බලපෑමට ලක් වූ ප්‍රජාවන්ගේ / පුද්ගලයින්ගේ අදහස් විමසීමද අත්‍යවශ්‍ය වේ. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත භාවිත කර ඇති ආකාරය සහ එමගින් සිදුව ඇති අපයෝජනය සම්බන්ධයෙන් නිසි අවධානයක් යොමු නොකිරීම තවදුරටත් අපයෝජන තත්ත්වයන් සිදු වීමට තුඩු දෙනු ඇත.

අනාගත නීති ප්‍රතිසංස්කරණ කටයුතු සම්බන්ධයෙන් අදාළ වන සියලුම පාර්ශ්වකරුවන් සම්බන්ධ කර ගනිමින් විනිවිද පෙනෙන සහ උපදේශනමය ක්‍රියාවලියක නිරත වීමට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ස්වකීය අඛණ්ඩ කැමැත්ත ප්‍රකාශ කරනු ලබයි.

**'ත්‍රස්තවාදය' යන්නෙහි අර්ථ දැක්වීම**

- යෝජිත ත්‍රස්ත විරෝධී පනතෙහි ත්‍රස්තවාදය නම් වරද යටතට වඩාත් පුළුල් පරාසයක ක්‍රියාවන් ඇතුළත් වේ. එකී ක්‍රියාවන්ගේ ලැයිස්තුව නොපැහැදිලි වන අතර ඒවා පුළුල් ලෙස අර්ථ දැක්විය හැකියාව ද පවතී. මෙම පුළුල් නිර්වචනය මඟින් ත්‍රස්තවාදය සම්බන්ධයෙන් චෝදනා එල්ල විය හැකි සහ අත්අඩංගුවට ගැනීම, රඳවා තබා ගැනීම සහ වෙනත් සීමා කිරීම්වලට යටත් විය හැක්කේ කාටද යන්න තීරණය කිරීමේ දී විධායකයට පුළුල් නිදහසක් ලබා දේ. එය සැබෑ ත්‍රස්තවාදී ක්‍රියාවලින් බොහෝ දුරස් වූ තත්වයන් තුළ හෝ සුළු ජාතීන්ට හෝ මානව හිමිකම් ආරක්ෂා කරන්නන්ට එරෙහිව වෙනස් කොට සැලකීමේ සහ පක්ෂග්‍රාහී ආකාරයෙන් භාවිත කළ හැකි බවට වන සැබෑ අවදානමක් ද මතු කරයි.

- එක්සත් ජාතීන්ගේ ව්‍යුහය තුළ, මෙම පදය පිළිබඳ විශ්වීය වශයෙන් එකඟ වූ නිර්වචනයක් නොමැති තත්ත්වයක් යටතේ, ''ත්‍රස්තවාදය'' යන අදහස විස්තර කරන විවිධ පාරිභාෂිතයන් එහි විවිධ ලේඛන තුළ සොයාගත හැකිය.

- ආරක්ෂක කවුන්සිලයේ 1373 (2001) යෝජනාව යටතේ රාජ්‍යය පාර්ශවයන්ට ස්වකීය වගකීම් ඉටු කිරීමට සහාය වීම අරමුණු කරගත් ආරක්ෂක කවුන්සිලයේ 1566 (2004) යෝජනාව මඟින්, දේශීය ව්‍යවස්ථාදායක ක්‍රියාමාර්ග ගැනීම සඳහා ත්‍රස්තවාදය පහත සඳහන් පරිදි නිර්වචනය කරනු ලබයි:

  *''සාමාන්‍ය ජනතාව තුළ හෝ පුද්ගල කණ්ඩායමක් තුළ හෝ සුවිශේෂී පුද්ගලයන් අතර භීෂණකාරී තත්ත්වයක් ඇති කිරීමේ අරමුණින් මරණය හෝ බරපතළ තුවාල සිදු කිරීම හෝ ප්‍රාණ ඇපයට ගැනීම සඳහා සිවිල් වැසියන්ට එරෙහිව ද ඇතුළුව සිදු කරන සාපරාධී ක්‍රියාවන්, ජනතාව බිය ගැන්වීම හෝ ත්‍රස්තවාදයට අදාළ ජාත්‍යන්තර සම්මුතීන් සහ ප්‍රොටෝකෝලවල විෂය පථය තුළ සහ නිර්වචනය කර ඇති වරදක් වන ඕනෑම ක්‍රියාවක් කිරීමට හෝ කිරීමෙන් වැළකී සිටීමට රජයකට හෝ ජාත්‍යන්තර සංවිධානයකට බල කිරීම, දේශපාලන, දාර්ශනික මතවාදී, වාර්ගික, ජනවාර්ගික, ආගමික හෝ වෙනත් සමාන ස්වභාවයක් ඇති සලකා බැලීම්වලින් යුක්ති සහගත නොවන වුත්, එවැනි ක්‍රියාවන් වැළක්වීමට සහ වළක්වා නොගන්නේ නම්, එවැනි ක්‍රියාවන්ට ඔවුන්ගේ බරපතල ස්වභාවයට අනුකූල දණ්ඩනයන් මගින් දඬුවම් කරන බව සහතික කරන ලෙස සියලුම රාජ්‍ය පාර්ශවයන්ගෙන් ඉල්ලා සිටී.''* (3 වන ඡේදය).

- ''ත්‍රස්තවාදී'' ලෙස සැලකෙන සන්නද්ධ ක්‍රියාකාරකම් ගණනාවක් අපරාධකරණය කිරීමට උත්සාහ කරන 49/60 මහා මණ්ඩල යෝජනාව මගින් 'ත්‍රස්තවාදය' යන්න පහත පරිදි නිර්වචනය කරනු ලබයි:

  *''දේශපාලනික, දාර්ශනික, දෘෂ්ටිවාදී, වාර්ගික, ජනවාර්ගික, ආගමික හෝ සාධාරණීකරණය කිරීමට අදහස් කරනු ලබන වෙනත් ස්වභාවයක ආදී වශයෙන් වූ කුමන කරුණක් මත වුවත්, දේශපාලන අරමුණු සඳහා පුද්ගලයන් හෝ විශේෂිත පුද්ගලයන් කණ්ඩායමක් හෝ, සාමාන්‍ය ජනතාව තුළ භීෂණකාරී තත්ත්වයක් ඇති කිරීමට අදහස් කරන හෝ ඉලක්ක කරන ලද ක්‍රියාවන් කිසිදු අවස්ථාවක සාධාරණීකරණය කළ නොහැකි ය.''* (3 වන ඡේදය).

- *ජාත්‍යන්තර ත්‍රස්තවාදය පිළිබඳ විස්තීරණ සම්මුතියේ කෙටුම්පතෙහි 2 වන ව්‍යවස්ථාවේ දැක්වෙන්නේ,*

  *''ඕනෑම පුද්ගලයෙක්, යම් ආකාරයකින්, නීති විරෝධීව සහ හිතාමතාම, පහත සඳහන් කරනු ලබන ක්‍රියාවක් කරන්නේ නම්, මෙම සම්මුතියේ අර්ථය තුළ වරදක් සිදු කරනු ලබයිඃ*

  *(අ) ඕනෑම පුද්ගලයෙකුගේ මරණය හෝ බරපතල ශාරීරික තුවාල සිදු කිරීම; හෝ*

  *(ආ) එවැනි ස්ථානයක්, පහසුකමක් හෝ පද්ධතියක් පුළුල් ලෙස විනාශ කිරීමේ අරමුණින් හෝ එවැනි විනාශයක් සිදු වන හෝ විශාල වශයෙන් සිදු වීමට ඉඩ ඇති ස්ථානයක රාජ්‍ය හෝ රජයේ පහසුකමකට, පොදු ප්‍රවාහන පද්ධතියකට, සන්නිවේදන පද්ධතියකට හෝ යටිතල පහසුකම්වලට බරපතළ හානි සිදු වීම හෝ විශාල ආර්ථික පාඩුවක් ඇති වීම හෝ එසේ විය හැකි වීම වන තත්ත්වයක දී එවැනි ක්‍රියාවක අරමුණ, එහි ස්වභාවය හෝ සන්දර්භය අනුව, ජනගහනයක් බිය ගැන්වීම හෝ රජයකට හෝ ජාත්‍යන්තර සංවිධානයකට කිසියම් ක්‍රියාවක් කිරීමට හෝ කිරීමෙන් වැළකී සිටීමට බල කිරීම.''*

**දඬුවම්**

- ත්‍රස්ත විරෝධී පනතෙහි 4(1)(අ) වගන්තිය යටතේ වෙනත් ඕනෑම පුද්ගලයෙකුගේ මරණයක් සම්බන්ධයෙන් වරදකරු වූ පුද්ගලයෙකුට මරණීය දණ්ඩනය පැනවීමට විධිවිධාන සලසයි. මරණීය දණ්ඩනය අහෝසි කිරීම/තහනම් කිරීම සඳහා කටයුතු කිරීම හොඳ භාවිතාවක් වශයෙන් පවත්නා සන්දර්භයක මෙන්ම කිසිදු මරණ වරෙන්තුවකට අත්සන් නොකිරීමට ජනාධිපතිවරයා කටයුතු කරනු ඇති පසුබිමක මෙය ප්‍රතිගාමී පියවරක් වේ.

- අලුතින් එකතු කරන ලද 'ත්‍රස්තවාදය දිරිමත් කරන ක්‍රියා' සහ 'ත්‍රස්තවාදී ප්‍රකාශන බෙදා හැරීම' යන වරදවල් අපැහැදිලි සහ පුළුල් ලෙස අර්ථ දක්වා ඇති අතර එමඟින් විශේෂයෙන් සිවිල් සමාජ ක්‍රියාකාරීන්ට, මාධ්‍යවේදීන්ට සහ මාධ්‍ය සංවිධානවලට එරෙහිව එම වරදවල් අවභාවිත කිරීමේ සහ අපයෝජනය කිරීමේ අවදානමක් උද්ගත කර ඇත.

**හමුදාකරණය**

- යෝජිත ත්‍රස්ත විරෝධී පනත මඟින් වරෙන්තුවක් නොමැතිව පුද්ගලයකු අත්අඩංගුවට ගැනීමට පොලිසියට, ත්‍රිවිධ හමුදාවේ සාමාජිකයින්ට සහ වෙරළාරක්ෂක නිලධාරීන්ට වඩාත් පුළුල් බලතල ලබාදෙයි. මෙම තත්ත්වය වූ කලී ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ දක්නට ලැබුණු හමුදාකරණයට ද වඩා වැඩි දුරකට හමුදාකරණය විධිමත් කිරීමකි. සන්නද්ධ හමුදාවන්ට සහ වෙරළාරක්ෂක බලකායට අත් අඩංගුවට ගැනීම් සිදු කිරීම සම්බන්ධයෙන් ඇති බලය හදිසි අවස්ථාවන්ට පමණක් සීමා නොවේ. ත්‍රිවිධ හමුදාවට සහ වෙරළාරක්ෂක අංශවලට ද සෝදිසි කිරීමේ සහ අල්ලා ගැනීමේ සමාන බලතල ලබා දී ඇත.

**දිගු කාලයක් රිමාන්ඩ් භාරයේ තැබීම / රඳවා තබා ගැනීම**

- පුද්ගලයෙකුට එරෙහිව චෝදනා ඉදිරිපත් කිරීමට පෙර රිමාන්ඩ් භාරයේ සිටින කාලය වසරකට සීමා කර ඉන් පසුව ඇප ලබා දීමට නියමිත වුවද, රිමාන්ඩ් භාරයේ තැබීමේ කාලය දින නියමයක් නොමැතිව දීර්ඝ කිරීමේ හැකියාව නීතිපතිවරයාට ලැබෙන ප්‍රතිපාදන ඇත.

- මීට පෙර ආරක්ෂක අමාත්‍යවරයාට පැවරී තිබූ බලයක් වූ රැඳවුම් නියෝග නිකුත් කිරීමේ බලය වත්මන් පනත යටතේ ඕනෑම නියෝජ්‍ය පොලිස්පතිවරයකුට භාවිත කළ හැකි බලයක් වශයෙන් ලබා දී ඇත.

- නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු විසින් නිකුත් කරන ලද මූලික රැඳවුම් නියෝග මහේස්ත්‍රාත්වරයෙකුගේ අවසරයකින් තොරව මාස තුනක් දක්වා දීර්ඝ කළ හැකි අතර, එකී මූලික මාස තුනෙන් ඔබ්බට මහේස්ත්‍රාත්වරයාගේ අනුමැතිය ඇතිව වසරක් දක්වා දීර්ඝ කරනු ලැබිය හැක.

**සමාලෝචන යාන්ත්‍රණවල ස්වාධීනත්වය**

- රැඳවුම් නියෝගයක් නිකුත් කිරීමට එරෙහිව පරිපාලනමය සහන ලබාදිය යුතුද යන්න තීරණය කිරීම සඳහා සමාලෝචන මණ්ඩලයක් සහ ස්වාධීන සමාලෝචන කමිටුවක් පවතින අතර, මෙම කමිටු දෙකම ජනාධිපතිවරයාගේ තනි අභිමතය පරිදි පත් කරන ලද සාමාජිකයින්ගෙන් සමන්විත බැවින් ඒවායේ ස්වාධීනත්වය සැක සහිතය.

**විධායකයේ බලතල: නියෝග සහ රෙගුලාසි**

- තහනම් නියෝගයන් නිකුත් කිරීමට ජනාධිපතිවරයාට ලබා දී ඇති බලය පුළුල් වන අතර, විසම්මුතිය සීමා කිරීමට සහ නීත්‍යානුකූල මානව හිමිකම් අවශ්‍යතා වෙනුවෙන් පෙනී සිටින සංවිධාන තහනම් කිරීමට එකී බලය අයුතු ලෙස භාවිත කරනු ලැබිය හැකිය. එවැනි තහනම් නියෝගයක් අභියෝගයට ලක් කිරීමට උනන්දුවක් දක්වන කිසිදු පාර්ශ්වයක් සඳහා ත්‍රස්ත විරෝධී පනතෙහි ඵලදායී අධිකරණ වශයෙන් ගත හැකි පිළියමක් සලසා දී නොමැත. පවතින පනත් කෙටුම්පත ඔස්සේ හුදෙක් ඵලදායී නොවන සහ රාජ්‍යයේ / නීතිපති දෙපාර්තමේන්තුවේ තාක්ෂණික අභියෝගවලට යටත් වන එක් අධිකරණ මාර්ගයක් සපයයි.

- ජනාධිපතිවරයා වෙත ලබා දී ඇති නියෝග සෑදීමේ බලය සඳහා වන විෂය පථය අතිශයින් පුළුල් වන අතර, පනතේ 'අරමුණු සහ මූලධර්ම' බලාත්මක කිරීම සඳහා රෙගුලාසි සැකසීමට ඉඩ සලසයි. මෙය දශක ගණනාවක් තිස්සේ අපයෝජනයට ලක් වූ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ඇති නියෝග සැකසීම සම්බන්ධයෙන් වූ පුළුල් බලයට සමාන ය. පනතේ අරමුණු සහ මූලධර්ම මොනවාද යන්න ත්‍රස්ත විරෝධී පනතෙහි නිශ්චිතව දක්වා නොමැති බැවින් මෙය විශේෂයෙන් අවධානය යොමුකළ යුතු කරුණක් බවට පත් වේ. මෙම පනතේ පූර්විකාව සහ දිගු මාතෘකාව මෙම කාරණය සම්බන්ධයෙන් කිසිදු ප්‍රයෝජනවත උපදෙසක් සැපයීමට නොහැකි තරම් පුළුල් සහ අපැහැදිලි ය.

- පුනරුත්ථාපන වැඩසටහන් පිහිටුවීමට අවශ්‍ය රෙගුලාසි සැකසීමේ බලය ජනාධිපතිවරයාට ලබා දී ඇත. මෙම පුනරුත්ථාපන වැඩසටහන් සඳහා යොමු කිරීම ස්වේච්ඡාවෙන් සිදු නොවිය හැකි අතර, ඊට අමතරව, අධිකරණයක් විසින් වරදකට වැරදිකරුවන් කර නොමැති පුද්ගලයින් මෙම පුනරුත්ථාපන වැඩසටහන් සඳහා අනිවාර්යයෙන් යැවීමට ඉඩ ප්‍රස්ථාව ඇති අතර, එමඟින් වරදකරු වන තුරු නිර්දෝෂීභාවයේ මූලධර්මය සහ යාමේ ඊමේ නිදහස ඇතුළු ඔවුන්ගේ මූලික අයිතිවාසිකම් ගණනාවක් උල්ලංඝනය වේ.

ඉහතින් ඉස්මතු කර පෙන්වාදෙන ලද කරුණු සැලකිල්ලට ගනිමින්, ගැටලුකාරී විධිවිධානවලින් පිරී ඇති යෝජිත ත්‍රස්ත විරෝධී පනත ඉවත් කර ගන්නා ලෙස විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය රජයෙන් ඉල්ලා සිටින අතර, ත්‍රස්ත විරෝධී නීතියක් කෙටුම්පත් කිරීම සඳහා වන ඕනෑම නව ක්‍රියාවලියක් විනිවිදභාවයෙන්, වගවීමෙන් සහ අදාළ සියලුම පාර්ශවකරුවන් අතර ශක්තිමත් උපදේශන ක්‍රියාවලියක ප්‍රතිඵලයක් වශයෙන් නිර්මාණය විය යුතු නීතියක් බව නැවත අවධාරණය කර සිටී.

අනාගත ත්‍රස්ත විරෝධී නීති ඉහතින් පෙන්වා දෙන ලද ගැටළුකාරී තත්ත්වයන් ආමන්ත්‍රණය කරන බවත් වර්ෂ 2021 දෙසැම්බර් මාසයේදී එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරුවන් හත් දෙනෙකු විසින් සකස් කරන ලද මිනුම් සලකුණු පහට[1] අනුකූල වන බවටත් සහතික කරන ලෙස විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය රජයෙන් ඉල්ලා සිටී.

1. ජාත්‍යන්තර සම්මතයන්ට අනුකූල වන පරිදි ත්‍රස්තවාදය සම්බන්ධයෙන් වන නිර්වචන භාවිත කිරීම;

2. විශේෂයෙන්ම එය අදහස් ප්‍රකාශ කිරීමේ, මතයක් දැරීමේ, ආශ්‍රය සමාගමයේ යෙදීමේ, ආගමේ හෝ විශ්වාසයේ නිදහසට බලපෑම් කළ හැකි තත්ත්වයන්හිදී නීතිමය නිශ්චිතභාවය පැවතීම;

3. අත්තනෝමතික ලෙස නිදහස අහිමි කිරීම වැළැක්වීම;

4. වධහිංසා පැමිණවීම සහ බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම වැළැක්වීම;

5. නියමිත නෛතික ක්‍රියාවලිය, සාධාරණ නඩු විභාගය, අධිකරණ අධීක්ෂණය සහ නීති උපදෙස් සඳහා ප්‍රවේශය සහතික කිරීම.

[1] OHCHR, එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරුවන්ගේ නිවේදනය, Ref.: OL LKA 7/2021, 2021 දෙසැම්බර් 9. <https://spcommreports.ohchr.org/TMResultsBase/DownLoadPublicCommunicationFile?gId=26863> 2023 මැයි මස 28 වන දින ප්‍රවේශ විය.